**බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව - 2022**
**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සභාව සතු ඉඩම් වල ඉදිකර තිබූ රු.18,572,604 ක් වූ ගොඩනැගිලි 03 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් යටතේ රු.90,000 කට කර තිබූ ට්‍රැක්ටර්, ට්‍රේලර් අළුත්වැඩියා වියදම ප්‍රාග්ධනිත කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.71,500 ක් වූ උසාවි දඩ ඌන බිල් කිරීම් සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර නොකර, සමුච්චිත අරමුදලට බැර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ බිල්පත් ඉදිරිපත් කර නොතිබුණු කර්මාන්ත 08 ක් සඳහා වූ රු.11,038,324 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (ඉ) | 2019 වර්ෂයට අදාළව ගිණුම් ගතකර නොතිබුණු රු.812,394 ක මුද්දර ගාස්තු ලැබීම්, ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමට බැර කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

### නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br><br>23 හා 24 වගන්ති | මාර්ග පිළිබඳ විස්තර ඇතුළත් මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නඩත්තු කළයුතු වුවත්, 2012 වර්ෂයෙන් පසු එම ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| 182 වගන්තිය | වර්ෂය තුළ රු.94,630 ක හිඟ හිටි වෙළඳ බලපත්‍ර ගාස්තු කපා හැර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ආදායම් කපා හැරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.69,748,149 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.59,641,915 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,430,000 | 20,802,543 | 12,490,892 | 76,797,174 | 16,645,550 | 17,210,825 | 7,561,642 | 68,496,636 |
| කුලී | 4,441,500 | 3,276,096 | 4,966,449 | 3,050,814 | 5,859,800 | 3,003,000 | 3,040,897 | 4,741,167 |
| බලපත්‍ර ගාස්තු | 1,260,150 | 1,050,304 | 847,514 | 812,650 | 1,370,150 | 507,160 | 512,910 | 609,860 |
| වෙනත් ආදායම් | 148,458,860 | 146,525,227 | 146,618,687 | 88,790 | 121,436,050 | 120,738,066 | 120,683,211 | 182,250 |
| | 172,590,510 | 171,654,170 | 164,923,542 | 80,749,428 | 145,311,550 | 141,459,051 | 131,798,660 | 74,029,913 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනයට සම්බන්ධ නිරීක්ෂණ පහත දැක් වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟය රු.74,019,913ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ රු.80,749,428 ක හිඟයක් පැවතුණි. ඒ තුළ වරිපනම් හා බදු හිඟ ශේෂය රු.76,797,174 ක් විය. | හිඟ ආදායම් රැස් කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 38 ක ගිවිසුම් කාලය ඉකුත් වී තිබුණි. කඩ කාමර 28 ක කඩ හිමියන් සමඟ අත්සන් කර තිබූ ගිවිසුම් පත්‍ර වල ගිවිසුමේ වලංගු කාලසීමාව දක්වා නොතිබුණි.එමෙන්ම සභාවේ පූර්ව අනුමැතියක් නොමැතිව කඩ කාමර අංක 09 අතුරු බදු දී තිබුණි. | ඉදිරියේදී නව ගිවිසුමකට එළඹීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව හා බදුකරුවන් පමණක් වෙළදාම් කරන බව. | ගිවිසුම්වලට වලංගු කාලය අන්තර්ගත විය යුතු අතර, ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.364,500 ක් හා මුද්දර ගාස්තු රු.121,920,175 ක් විය. | ඉදිරියේදී ප්‍රධාන ලේකම් මගින් අය කරන බව. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කර්මාන්ත දෙකකට අදාළව මාර්ගයේ දෙපස කැලෑ කැපීම සඳහා MS 24 මිල අනුපාතය භාවිතා නොකිරීම නිසා රු.64,135 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | රඳවුම් මුදලින් අඩුකර ගෙවීම් කරන බව. | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගත යුතු වේ. |
| (ආ) | කොන්ත්‍රාත්කරු සමඟ ඇතිකරගත් ගිවිසුම්ගත දිනය අනුව කර්මාන්ත 6 කට අදාළව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබුණු 2022 සැප්තැම්බර් මිල අනුපාතය භාවිතා කළයුතු වුවද, එම මිල අනුපාතය භාවිතා නොකිරීම නිසා කර්මාන්ත 03 කට අදාළව රු.586,472 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණු අතර, තවත් කර්මාන්ත 03 ක් සඳහා රු.534,016 ක් වැඩිපුර ඇස්තමේන්තු කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් ලද පසු ගෙවීම් කටයුතු සිදු කරන බව. | - එම - |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය, මිය ගිය හා වැඩ තහනමට ලක් වූ සේවකයින් 30 දෙනෙකුගෙන් 2013 වර්ෂයේ සිට රු.430,349 ක ණය මුදලක් අයකර ගත නොහැකි වී තිබුණි. | දිගු කාලයක් තිස්සේ ණය ශේෂ අය නොවී පවතින අතර, පැරණි ලේඛන විනාශ වී ඇති බව. | හිඟ සේවක ණය ශේෂ අයකර ගත යුතු වේ. |